# මාසික

# විවරණිකාව

2012 මාර්තු



ශ්‍රී ලංකා මහ බැංකුව

# ශ්‍රී ලංකා මහ බැංකුව

## විවරණිකාව

**62 වැනි වෙළුම 03 වැනි කලාපය**

**2012 මාර්තු**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විවරණිකාව, මාණ්ඩලික සංස්කාරක කමිටුවක විධානයන් යටතේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මාසිකව නිකුත් කරනු ලැබේ.

නිල වාර්තා හා පෞද්ගලික නම්වලින් පළ කෙරෙන ලිපි හැර, මෙහි පළවී ඇති අනෙකුත් අර්ථ කථනයන් සහ අදහස් සම්බන්ධයෙන් එම කමිටුව විසින් වගකීම දරනු ලැබේ. එසේ වුවද, මෙම අර්ථ කථනයන් සහ අදහස් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් ලෙස පිළිගත යුතු නොවේ.

හිමිකම් ඇසුරුණු බව දක්වා ඇති අවස්ථාවන්හි දී හැර, මෙම විවරණිකාවෙහි පළවෙන ඕනෑම කරුණක් පූර්ව අනුමැතියක් නොලබා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ නැවත පළ කිරීමට හෝ පරිවර්තනය කිරීමට අවසර ඇත. එහෙත් එසේ නැවත පළ කිරීමේදී හෝ පරිවර්තනය කිරීමේ දී එම කරුණු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සහ විවරණිකාවෙන් උපුටා ගත් බව සඳහන් කළයුතුයි.

**ISSN 1391 - 3654**

**ප්‍රකාශය: ශ්‍රී ලංකා මහ බැංකුව , කොළඹ 01.**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1 වන කොටස - මාසික සිදුවීම් - 2012 මාර්තු | .... | 05 - 06 |
| 2 වන කොටස - පුවත්පත් නිවේදන - 2012 මාර්තු | .... | 07 |
| 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 මාර්තු | .... | 07 - 08 |
| 2. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම | .... | 08 |
| 3. 2012 ජනවාරි මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය | .... | 09 - 11 |
| 4. ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයේ ශත සංවත්සරය සැමරීම වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීම | .... | 11 - 12 |
| 5. උද්ධමනය ඛනිජ තෙල් සහ බස් ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් 2012 මාර්තු මාසයේ දී ඉහළ නගියි | .... | 13 |
| 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 2010, 2011 සහ 2012 | .... | 14 |

# 1 වන කොටස

# මාසික සිදුවීම්

## 2012 මාර්තු

### රාජ්‍ය මූල්‍ය අංශය

- අර්තාපල් ආනයනය සඳහා අයකරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයකට රුපියල් 30 දක්වා වැඩිකරන ලදී.

- ආනයනික මෝටර් වාහන අමතර කොටස් සඳහා වන තීරු බද්ද සංශෝධනය කරන ලදී.

- සං.ව.ශීර්ෂ 87.03 සහ 87.02 යටතේ ආනයනයට සුදුසු මෝටර් රථවල (බස් රථ හැර) යෝග්‍ය කාලසීමාව අවුරුද්දක් දක්වා ද සං.ව.ශීර්ෂ 87.04 යටතේ ආනයනයට සුදුසු මෝටර් රථවල යෝග්‍ය කාලසීමාව අවුරුදු 3 1/2 දක්වා ද සංශෝධනය කරන ලදී.

- මෝටර් රථ, ත්‍රී රෝද රථ සහ යතුරු පැදි ආනයනය සඳහා නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

- මධ්‍යසාර (මෝල්ට් මධ්‍යසාර හැර) සහ මෝල්ට් මධ්‍යසාර සඳහා සුරා බදු පිළිවෙලින් සම්මත මධ්‍යසාර ලීටරයකට රුපියල් 60 කින් සහ තොග ලීටරයකට රුපියල 5 කින් වැඩි කරන ලදී.

- දුම්වැටි මත පනවා තිබූ නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

### ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් ලද ණය (JICA)

2012 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර ගිවිසුම් දෙකකට අත්සන් තබන ලදී. එම ගිවිසුම්වලට අදාළ තොරතුරු පහත පරිදි වේ.

1. **ජපන් යෙන් මිලියන 9,573 ක් වූ ණය මුදල**

   හබරණ - වේයන්ගොඩ විදුලි සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා ජපන් යෙන් මිලියන 9,573 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 15.0 ක) ණය මුදලක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.3 ක පොලී අනුපාතිකයක්ද, වාර්ෂිකව සියයට 0.1 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 40 ක් තුළදී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

2. **ජපන් යෙන් මිලියන 3,935 ක් වූ ණය මුදල**

   නැගී එන ප්‍රදේශයන්හි මූලික සමාජ සේවා කටයුතු වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා ජපන් යෙන් මිලියන 3,935 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 6.2 ක) ණය මුදලක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.2 ක පොලී අනුපාතිකයක් සහ වාර්ෂිකව සියයට 0.1 ක අනිවාර්ය ගෙවීමක් අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 40 ක් තුළ දී මෙම ණය මුදල ගෙවා නිම කළ යුතුය.

### ජාත්‍යන්තර සංවර්ධන ආයතනයෙන් ලද ණය (IDA)

ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් මාධ්‍ය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අතිරේක අරමුදල් සම්පාදනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය අතර, 2012 මාර්තු මස 01 වැනි දින වි.ගැ.හි.මිලියන 7.1 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.3 ක) ණය මුදලක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 1.25 ක පොලී අනුපාතිකයක් ද, වාර්ෂිකව

සියයට 0.75 ක සේවා ගාස්තුවක් ද, සියයට 0.5 ක අනිවාර්ය ගෙවීමක් ද අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 20 ක් තුළදී මෙම ණය මුදල ගෙවා අවසන් කළ යුතුය.

**ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධන අරමුදලෙන් ලද ණය (IFAD)**

ඉරනමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මූල්‍යනය කිරීමේ අරමුණින් 2012 ජනවාරි මස 30 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධන අරමුදල අතර, වි.ගැ.හි.මිලියන 14.35 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 2.5 ක) ණය මුදලක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී. මෙම ණය මුදල සඳහා වාර්ෂිකව සියයට 0.75 ක පොලී අනුපාතිකයක් අදාළ වේ. වසර 10 ක සහන කාලයකට යටත්ව වසර 40 ක් තුළදී මෙම ණය මුදල ගෙවා අවසන් කළ යුතුය.

**ජපන් රජයෙන් ලද ප්‍රදාන**

කිලිනොච්චි ජල සැපයුම් ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා 2012 මාර්තු මස 6 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ජපාන රජය අතර, ජපන් යෙන් මිලියන 677 ක (ආසන්න වශයෙන් රුපියල් බිලියන 1.5 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**ජපාන රජයෙන් ලද ප්‍රදාන**

කැළණිය සහ සබරගමුව විශ්ව විද්‍යාලයන්හි ජපන් භාෂා ඉගෙනුම් උපකරණ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ජපන් රජය අතර 2012 මාර්තු මස 6 වැනි දින ජපන් යෙන් මිලියන 48.4 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 449 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

**ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන කටයුතු සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් ලද ප්‍රදාන (IBRD)**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනයට අරමුදල් සම්පාදනය කිරීමේ අරමුණින් 2012 මාර්තු මස 22 වැනි දින ශ්‍රී ලංකා රජය සහ ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන කටයුතු සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර, එ.ජ.ඩොලර් මිලියන 0.5 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 65 ක) ප්‍රදානයක් සඳහා ගිවිසුමකට අත්සන් තබන ලදී.

## II වන කොටස

# පුවත්පත් නිවේදන

## 2012 මාර්තු

### 1. මුදල් ප්‍රතිපත්ති විවරණය - 2012 මාර්තු

*ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව දෙවන වසරටත් සියයට 8 ඉක්මවූ ඉහළ වර්ධනයක් වාර්තා කළේය. දිගින් දිගටම පැවති හිතකර දේශීය සැපයුම අන්තර්ජාතික වෙළෙඳපොළේ පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ඉහළ යාම හේතුවෙන් ඇති වූ බලපෑම බොහෝ දුරට සමනය කිරීමට ද උපකාරී විය.*

මෙහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය මාස තිස් හත පුරා උද්ධමනය තනි අගයක පැවති අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (පදනම් වර්ෂය = 2006/07) වාර්ෂික ලක්ෂ්‍යාමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය 2012 පෙබරවාරි මාසය වන විට සියයට 2.7 දක්වා අඩු වූ අතර, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 6.1 ක් දක්වා අඩු විය. මෙම වාතාවරණය තුළ 2009 දී තනි අගයක් දක්වා පහත බසින ලද දේශීය පොලී අනුපාතික, ආයෝජන දිරිමත් කරමින් 2011 වසරේ බොහෝ කාලයක් දක්වා සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවතුණි.

කෙසේ වුවද, දේශීය ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීමට තුඩු දුන් ඉහළ ගිය ආයෝජක විශ්වාසය, වසර තුළ දී ආනයන සාපේක්ෂ වශයෙන් ඉහළ යාමට ද හේතු විය. මෙය, ගෙවුම් තුලනයේ වෙළෙඳ ගිණුම තුළ අපේක්ෂිත මට්ටම ඉක්ම වූ හිඟයක් ඇති වීමට හේතු විය. මේ අතරම, 2012 ජනවාරි මාසය තුළ දී පුළුල් මුදල් හි වර්ධනය තව දුරටත් ඉහළ අගයක පැවති අතර, පෞද්ගලික හා රාජ්‍ය අංශ යන දෙක විසින්ම ලබාගත් ණය ඉහළ යාම හේතුකොට ගෙන පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනය සියයට 20.1 ක් විය. පෞද්ගලික අංශය විසින් ලබාගත් ණය තවදුරටත් ඉහළ අගයක පැවති අතර, 2012 ජනවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනය අනුව එය සියයට 34.3 ක් විය. මෙම වර්ධනයන්ට ප්‍රතිචාර ලෙස 2012 පෙබරවාරි මාසයේ දී රජය හා මහ බැංකුව විසින් වෙළෙඳ හිඟය අඩු කිරීමේ අභියෝගයට මුහුණ දීමට මෙන්ම පුළුල් මුදල් වර්ධනය, ණය වර්ධනය හා ආනයන වර්ධනයෙහි ඇති වෙමින් පවතින අසමතුලිතතාවන් සඳහා සඵල පිළියමක් යෙදීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

කෙසේ නමුත්, මෙම ක්‍රියාමාර්ග තුළින් අපේක්ෂිත ප්‍රතිඵල උදාකරගත හැකි වුවද, විශේෂයෙන්ම මෙම ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵල ලෙස ඉහළ ගිය බලශක්ති මිල ගණන්, ණය ප්‍රමාණය අඩුවීම හා ආනයන ආශ්‍රිත කටයුතු පහතයාම හේතුවෙන් මෙතෙක් දේශීය ආර්ථික කටයුතුවල පැවති ඉහළ ක්‍රියාකාරිත්වය මත යම් බලපෑමක් ඇති විය හැක. මෙම වාතාවරණය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය, පෙර අපේක්ෂිත සියයට 8 මට්ටමට සාපේක්ෂව, සියයට 7.2 ක පමණ වර්ධන වේගයකින් 2012 තුළ දී වර්ධනය වනු ඇතැයි මහ බැංකුවේ පුරෝකථන මගින් පෙන්වනු ලැබේ. මේ අතරම මෑතක දී ගන්නා ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් සමාහාර ඉල්ලුමේ යම් මන්දගාමීවීමක් හා ඒ තුළින් මිල ගණන් මත ඇතිවන පීඩනයේ යම් අඩුවීමක් හේතුවෙන් පරිපාලිත මිල ගණන්වල මෑතක දී සිදුකරන ලද සංශෝධන හේතුවෙන් මිල මට්ටම මත සැපයුම් අංශයෙන් ඇති වන පීඩනය යම් දුරකට සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2012 තුළ දී උද්ධමනය මැදි තනි අගයක පවතිනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් 2012 වසර තුළ දී පුළුල් මුදල්හි වර්ධනය ඉලක්කගත මට්ටම දක්වා ක්‍රමයෙන් අඩුවනු ඇතැයි ද, මේ හේතුවෙන් ඉදිරියේ දී ඇති විය හැකි උද්ධමනාත්මක පීඩන යටපත් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

මෙම නව ක්‍රියාමාර්ග හේතුවෙන් ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන් ගමනාගමනය මෙන්ම බලශක්තිය නිපදවීම සඳහා ඛනිජතෙල් යොදා ගැනීමේ දී ඵලදායිතා ප්‍රතිලාභ වැඩි වන අයුරින් යොදාගැනීමට පෙළඹෙනු ඇතැයි ද, යම් දුරකට ඛනිජ තෙල් ආනයන වියදම අඩු කරමින් මහජනතාව ක්‍රියාකාරී ලෙස බලශක්තිය සංරක්ෂණය කිරීමට පෙළඹෙනු ඇතැයි ද මහ බැංකුවේ මතය වේ. තවද, මේ වන විට රථවාහන අලෙවිකරුවන් අතර පසුගිය මාස කිහිපය තුළ සැලකිය යුතු ප්‍රමාණයක රථවාහන තොග ගොඩනැගී ඇති බැවින් බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන විසින් රථවාහන ආනයන සඳහා දෙනු ලබන ණය ප්‍රමාණය විචක්ෂණශීලීව සීමා කරනු ඇතැයි ද, මේ තුළින් ආනයන වියදම මත ඇති වන පීඩනය යම් දුරකට අඩුවනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

මුදල් හා සාර්ව ආර්ථිකමය වශයෙන් ගන්නා ලද විවිධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල අපේක්ෂිත ප්‍රතිඵල හේතුවෙන් වර්තමානයේ පවතින ගැටලු නිසි ලෙස නිරාකරණය කිරීම සඳහා වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව 2012 මාර්තු 13 දින පැවති රැස්වීමේ දී මුදල් මණ්ඩලයේ මතය විය. මේ නිසා මහ බැංකුවේ ප්‍රතිපත්ති ස්ථාවරය දැනට නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළ අතර, මේ අනුව ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය සියයට 7.50 ලෙස ද, ප්‍රතිවිකුණුම් අනුපාතිකය සියයට 9.00 ලෙස ද, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 8.00 ලෙස ද පවත්වා ගැනීමට තීරණය කරන ලදී.

මීළඟ නියමිත මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මාසික විවරණය 2012 අප්‍රේල් මස 18 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

## 2. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම

*ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය* (SLDBs) *සමග තරගකාරී ලංසු තැබීම් තුළින් තීරණය වූ ආන්තික පොලී අනුපාතිකයන් සහිත එක්සත් ජනපද ඩොලර් මිලියන 35 ක ප්‍රමාණයක් වසර 3 ක බැඳුම්කරවලින් සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක ප්‍රමාණයක් වසර 4 ක බැඳුම්කරවලින් ද සුදුසුකම් ලද ආයෝජකයින්ට ඉදිරිපත් කරන ලදී.*

මෙම නිකුතුව 2012 මාර්තු මස 12 සිට 19 දක්වා විවෘතව තිබූ අතර 2012 මාර්තු 26 වැනි දින ගෙවීම් කළ යුතු වේ. දේශීය හා විදේශීය වාණිජ බැංකු වෙන්දේසිය සඳහා ලංසු ඉදිරිපත් කරනු ලැබිණි. මෙම ඉදිරිපත් කිරීම සඳහා 2.2 වාරයක අධි දායකත්වයක් ලබා නිමින් එක්සත් ජනපද ඩොලර් මිලියන 100 ක ලංසු ලැබී තිබුණි. ආයෝජකයන්ගෙන් ලැබුණු ඉහළ ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින් එක්සත් ජනපද ඩොලර් මිලියන 72 ක ප්‍රමාණයක් වසර 3 කින් කල්පිරෙන බැඳුම්කරවලින් සහ එක්සත් ජනපද ඩොලර් මිලියන 12 ක ප්‍රමාණයක් වසර 4 කින් කල්පිරෙන බැඳුම්කරවලින්, පිළිවෙළින්, හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සහ වෙළෙඳපොළ මගින් තීරණය වූ පොලී අනුපාතිකයන් වූ පාදකාංක 385 ක, (බර තැබූ සාමාන්‍ය ආන්තිකයක්) සහ පාදකාංක 415 ක් (බර තැබූ සාමාන්‍ය ආන්තිකයක්) යටතේ පිළිගැනීමට රජය තීරණය කරන ලදී. අද දින එක්සත් ජනපද ඩොලර් සඳහා වන හය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය සියයට 0.74 ක් වේ.

මෙම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව 1957 අංක 29 දරන විදේශ ණය පනතේ 2(අ) හා 2(ඇ) වගන්ති යටතේ නිකුත් කෙරිණ.

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිටසන් කර භාර දීමෙන් පසුව එය ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී වෙත ලියාපදිංචි කිරීමෙන් පැවරීම සිදු කළ හැකිය. සුදුසුකම් ලත් ආයෝජකයින්ට ද්විතීයික වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයින් මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිල දී ගත හැකිය.

## 3. 2012 ජනවාරි මාසයේ විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය

*2011 ජනවාරි මාසය සමග සැසඳීමේ දී 2012 ජනවාරි මාසයේ දී අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 918 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කෘෂිකාර්මික අපනයන ඉපයීම් පහත වැටීමත්, 2011 ජනවාරි මාසයේ පැවති ඉහළ පදනම් අගයත් නිසා වේ. මේ අතරතුර, 2012 වසරේ ජනවාරි මාසයේ දී අඛණ්ඩව දෙවන මසටත් ආනයන වියදම වැඩිවීමේ වේගයේ අඩුවීමක් පෙන්නුම් කරමින් ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,883 ක් දක්වා සියයට 20.1 කින් වර්ධනය විය.*

2012 ජනවාරි මාසයේ මුළු අපනයන ආදායමට සියයට 80 ක පමණ දායකත්වයක් දක්වන කාර්මික අපනයනඑ.ජ.ඩොලර්මිලියන733ක්දක්වා සියයට3.3කින් වර්ධනය විය. රෙදිපිළි හා ඇඟළුම් අපනයන, කාර්මික අපනයනවලින් වැඩිම දායකත්වයක් ලබා දෙමින් එ.ජ.ඩොලර් මිලියන 367 ක් දක්වා සියයට 1.6 කින් වර්ධනය විය. නැව්වලට සපයන ඉන්ධන ඉහළ යාම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන එ.ජ.ඩොලර් මිලියන 45 ක් දක්වා සියයට 106.2 කින් වර්ධනය විය. විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ප්‍රධාන අපනයන කරනු ලබන රටවල ඉල්ලුම වැඩිවීම හේතුවෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදිත සියයට 20.7 කින් වර්ධනය විය. 2011 අනුරූප මාසය සමග සැසඳීමේ දී, 2012 ජනවාරි මාසයේ අපනයන ඉපැයීම් තුළ ඇති මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සියයට 44.6 කින් සහ යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සියයට 28 කින් ද වර්ධනය විය. 2012 ජනවාරි මාසයේ දී කාර්මික අපනයන අතුරින් ප්‍රවාහන උපකරණ, ආහාර පාන හා දුම්කොළ, මුද්‍රණ සහ හම් නිෂ්පාදිත සහ සංචාරක භාණ්ඩ හා පාවහන් යනාදිය මුළු අපනයනවලින් සියයට 11 ක පමණ දායකත්වයක් දැක්වූ අතර මෙය පසුගිය වසරේ ජනවාරි මාසය සමග සැසඳීමේ දී සියයට 32.1 කින් පහත වැටුණි. 2012 ජනවාරි මාසයේ දී තේ සහ රබර් වැනි සම්ප්‍රදායික කෘෂි අපනයනවල අඩු ක්‍රියාකාරිත්වය හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම අඩු විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ප්‍රධාන වශයෙන් තේ ආනයන කරන රටවල ඇති වූ භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් හේතුවෙන් තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 104 ක් දක්වා සියයට 19.1 කින් පහත වැටුණි. දේශීය රබර් නිෂ්පාදිත කර්මාන්ත විසින් රබර් සඳහා පවතින ඉල්ලුම තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් රබර් අපනයන ආදායම පහත වැටුණි. 2012 ජනවාරි මාසයේ දී සාම්ප්‍රදායික කෘෂිකාර්මික අපනයන හැරුණ විට කුළුබඩු, එළවළු සහ සුළු කෘෂිකාර්මික අපනයනයන්වලද යම් පසුබෑමක් වාර්තා විය. කෙසේ වුවද, යහපත් කාලගුණික තත්ත්වය සහ රජයේ පොහොර සහනාධාර වැඩ සටහනේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය වර්ධනය වීම හේතුවෙන් පොල් අපනයන ආදායම වර්ධනය විය. 2012 ජනවාරි මාසයේ දී කෘෂිකාර්මික අපනයන වන මුහුදු ආහාර සහ සකස් නොකළ දුම්කොළ අපනයන ද යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී. ශීතකළ මාළු සහ අනෙකුත් මාළු අපනයන වැඩිවීම නිසා මුහුදු ආහාර අපනයන වර්ධනය වේගවත් විය.

2011 වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසයේ වාර්තා වූ සියයට 78.5 ක් සහ 31.3 ක් වූ ආනයන වර්ධනය හා සැසඳීමේ දී 2012 ජනවාරි මාසයේ දී ආනයන වර්ධනය සියයට 20.1 ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි. ආනයන වියදම අඩු වීමට ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ කාණ්ඩයේ පවතින ඛනිජ නිෂ්පාදන සහ දියමන්ති හා අගනා ලෝහ ආනයනයන් ද පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ පවතින වාහන ආනයන අඩුවීම ද හේතු විය. එසේ නමුත්, 2012 ජනවාරි මාසයේ දී තවදුරටත් ආර්ථික ක්‍රියාකාරකම්හි පුළුල් වීම පිළිබිඹු කරමින්, ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 72.4 කින් වර්ධනය විය. ආයෝජන භාණ්ඩවලට අයත් ප්‍රධාන ආනයන කාණ්ඩ තුන වන ගමනාගමන උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍යය සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පිළිවෙළින් සියයට 100.3, 71.1 සහ 60.2 ක් යනාදී වශයෙන් ඉහළ වර්ධනයන් වාර්තා කරන ලදී. ඒ අතරම, ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් ආනයනය වැඩිවීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,065 ක් දක්වා සියයට 8.6 කින් වර්ධනය විය. සැලකිය යුතු ලෙස මිල ඉහළයාම පිළිබිඹු කරමින් 2011 ජනවාරි මාසය සමග සැසඳීමේ දී 2012 ජනවාරි මාසයේ දී ඛනිජ තෙල් ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 484 ක් දක්වා සියයට 18.9 කින් වර්ධනය විය. 2011 ජනවාරි මාසයේ දී බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 95.33 ක් වූ අතර, එය 2012 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් 115.62 ක් දක්වා සියයට 21.3 කින් වර්ධනය විය.







මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි බොර තෙල් මිල ගණන් ඉහළ යාම සඳහා බොහොමයක් තෙල් නිෂ්පාදිත රටවල වර්ධනය වෙමින් පවතින භූ-දේශපාලනික අස්ථාවරත්වය සහ යුරෝපයේ පවතින අධික ශීත කාලගුණය නිසා ඉල්ලුම වැඩි වීම ද හේතු විය. ඉහළ මිල ගණන් සහ ඉහළ ආනයන පරිමාව හේතුවෙන් පොහොර ආනයන වියදම ද වර්ධනය විය. අන්තර් භාණ්ඩ යටතේ පවතින මූලික ලෝහ, දියමන්ති සහ අගනා ලෝහ, වාහන හා යන්ත්‍ර සූත්‍ර කොටස්, ආහාර නිෂ්පාදිත සහ තිරිඟු හා ඉරිඟු ආනයනය 2012 ජනවාරි මාසයේ දී පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2012 ජනවාරි මාසයේ දී සියයට 3 කින් සුළු වශයෙන් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා උපාංග, ගෘහ උපකරණ සහ බෙහෙත් හා ඖෂධ වැනි ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ දායක විය. සීනි, පරිප්පු, ළූණු සහ අර්තාපල් වැනි ප්‍රධාන ආහාර ආනයනයන්හි ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවැති අඩු මිල ගණන් හේතුවෙන් ආහාර හා පාන ආනයන වියදම අඩු විය. 2012 අයවැය මගින් අළුත් කාණ්ඩ සඳහා බදු අනුපාත වැඩිකිරීම සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු (SCL) හඳුන්වා දීම ආහාර ආනයන වියදම අඩුවීමට යම් ආකාරයකින් දායක විය.

2011 ජනවාරි මාසයට සාපේක්ෂව 2012 ජනවාරි මාසයේ දී සංචාරක පැමිණීම් 85,874 ක් දක්වා සියයට 15.7 කින් වර්ධනය වූ අතර සංචාරක ඉපයීම් එ.ජ.ඩොලර් මිලියන 88 ක් දක්වා සියයට 22.9 ක ඉහළ වර්ධනයක් පෙන්වීය. 2012 ජනවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ලද මුළු ප්‍රේෂණ ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව සියයට 25.4 කින් වැඩි වී එ.ජ.ඩොලර් මිලියන 473 ක් වූ අතර එය 2011 ජනවාරි මස දී එ.ජ.ඩොලර් මිලියන 377 ක් විය. තවද, 2012 ජනවාරි මාසයේ දී රාජ්‍ය අංශය වෙත ලැබුණු මුළු විදේශ විනිමය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 296 ක් වූ අතර එය 2011 ජනවාරි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 184 ක් විය.

2012 ජනවාරි මාසය අවසාන වන විට, ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) ශේෂයන් රහිත දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 5,806 ක් විය. තවද, 2012 ජනවාරි මාසය අවසානයේ දී දළ නිල සංචිත හා වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,973 ක් විය. විදේශ සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2012 ජනවාරි මාසය අවසාන වන විට දී පැවති දළ නිල සංචිත සහ මුළු විදේශ සංචිත ප්‍රමාණය පිළිවෙළින් ආනයනික මාස 3.4 කට සහ 4.1 කට සමාන විය.

විදේශ වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ විස්තර පහත සඳහන් සංඛ්‍යා සටහනින් තවදුරටත් පැහැදිලි කෙරේ.

**සංඛ්‍යා සටහන 1**

## විදේශ අංශයෙහි ක්‍රියාකාරිත්වය

| කාණ්ඩය | 2011 ජනවාරි (අ) එ.ජ.ඩො. මිලියන | 2011 ජනවාරි (ආ) එ.ජ.ඩො. මිලියන | ජනවාරි වර්ධනය (සියයට) |
|---|---|---|---|
| **අපනයන** | **923.0** | **917.7** | **-0.6** |
| කෘෂිකාර්මික | 210.7 | 181.5 | -13.9 |
| මෙයින්: තේ | 128.5 | 103.9 | -19.1 |
| කාර්මික | 708.9 | 732.6 | 3.3 |
| මෙයින්: රෙදිපිළි හා ඇඟළුම් | 360.7 | 366.6 | 1.6 |
| රබර් නිෂ්පාදිත | 64.8 | 78.2 | 20.7 |
| ආහාර පාන හා දුම්කොළ | 27.2 | 20.8 | -23.6 |
| ඛනිජ ද්‍රව්‍ය | 2.6 | 2.6 | 0.7 |
| **ආනයන** | **1567.9** | **1883.3** | **20.1** |
| පාරිභෝගික භාණ්ඩ | 279.2 | 287.7 | 3.0 |
| මෙයින්: ආහාර හා පාන වර්ග | 129.7 | 124.5 | -4.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 149.5 | 163.2 | 9.2 |
| අන්තර් භාණ්ඩ | 980.4 | 1,065.1 | 8.6 |
| මෙයින්: ඛනිජ තෙල් | 406.9 | 483.6 | 18.9 |
| රෙදිපිළි හා ඇඟළුම් | 197.9 | 203.0 | 2.6 |
| ආයෝජන භාණ්ඩ | 303.5 | 523.3 | 72.4 |
| මෙයින්: යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 156.2 | 250.3 | 60.2 |
| ප්‍රවාහන උපකරණ | 72.2 | 144.7 | 100.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 74.7 | 127.7 | 71.1 |
| **වෙළෙඳ හිඟය** | **644.9** | **965.5** | **49.7** |
| **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ** | **377.0** | **473.0** | **25.4** |
| **සංචාරක ඉපැයීම්** | **72.0** | **88.0** | **22.9** |
| **විදේශීය සෘජු ආයෝජන** | **1,066.0** (ඇ) | ලැ.නො. | ලැ.නො. |
| **රාජ්‍ය අංශයේ ලැබීම්** | **184.0** | **296.0** | **60.9** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) 2011 වසර සඳහා විදේශීය සෘජු ආයෝජන

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## 4. ශ්‍රී ලංකා බාලදක්ෂ ව්‍යාපාරයේ ශත සංවත්සරය සැමරීම වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීම

*බාලදක්ෂ ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කොට වසර 100 ක් සපිරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් 2 ක වටිනාකමින් යුත් සංසරණ තත්ත්වයේ සමරු කාසියක් නිකුත් කරනු ලබයි. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1957 වර්ෂයේ නිකුත් කරන ලද ප්‍රථම සමරු කාසියේ සිට මේ දක්වා නිකුත් කරන ලද 56 වන සමරු කාසියයි. මෙම කාසිය පහත සඳහන් ලක්ෂණවලින් සමන්විතය.*






- මුහුණත මැද, ලෝක බාලදක්ෂ ලාංඡනයද ඒ වටා සාමය හා සෞභාග්‍ය සංකේතවත් කිරීමට යොදාගන්නා සියපත් ලාංඡනයද දැක්වේ.
- ලාංඡනයේ මැද ජාතික කොඩියේ අන්තර්ගත සිංහයා දැක්වේ. "ශ්‍රී ලංකා බාලදක්ෂ ශත සංවත්සරය" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ලාංඡනය වටා දැක්වේ.
- ලාංඡනය වටා දැක්වෙන ලෝක බාලදක්ෂ ලාංඡනයේ අන්තර්ගත සංකේතයක් වන කඹය මගින් ලොව පුරා ඇති ජාතික බාලදක්ෂ සංගම්වල සාමූහිකත්වය සංකේතවත් කරයි.
- 1912 -2012 යන වර්ෂ සමගින් ශත සංවත්සරයේ තේමාව වන "යහපත් ලොවක් සඳහා එක්වෙමු" යන්න සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පරිධියේ දැක්වේ.
- කාසියේ පිටුපස මැද කාසියේ මුහුණත වටිනාකම වන රුපියල් 2 විශාල ඉලක්කමෙන් දැක්වෙන අතර, "රුපියල් දෙකයි" යන්න සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් මුහුණත වටිනාකම හරහා දැක්වේ.
- "ශ්‍රී ලංකා" යන්න සිංහල බසින් කාසියේ ඉහළ මැද ද, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් කාසියේ පරිධියේ ද දැක්වේ. "2012" යන්න කාසියේ පහළ මැද දැක්වේ.

නිකල් ආලේපිත වානේ යොදා ගනිමින් ටංකනය කර ඇති මෙම කාසිය රවුම් හැඩයෙන් යුක්ත වන අතර, දැනට සංසරණයේ පවතින රුපියල් 2 කාසිය මෙන් විෂ්කම්භය මි.මී.28.5 ක් බර ග්‍රෑම් 7.0 කින් යුක්ත වේ.

ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා විසින් මුදල් ඇමති අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත 2012.04.01 වන දින දඹුල්ලේ දී පැවැත්වෙන ශත සංවත්සර උත්සවයේ දී නිල වශයෙන් මෙම කාසිය පිළිගන්වනු ඇත.

කොළඹ 1, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ මුදල් කවුළුවෙන්ද, රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කෞතුකාගාරයෙන් සහ අනුරාධපුර, මාතර, මාතලේ, යාපනය හා ත්‍රිකුණාමලයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ පළාත් කාර්යාලවලින් ද වාණිජ බැංකු වෙතින් ද 2012 මැයි මස සිට මෙම කාසිය එහි මුහුණත වටිනාකමට මහජනතාව සඳහා නිකුත් කිරීමට නියමිතය.

**වැඩි විස්තර සඳහා:**

| | | දුරකථන අංකය | ෆැක්ස් අංකය |
|---|---|---|---|
| ව්‍යවහාර මුදල් අධිකාරි | - | 0112477355 | 0112477726 |
| අතිරේක ව්‍යවහාර මුදල් අධිකාරි | - | 0112477603/0112477014 | |
| ජ්‍යෙෂ්ඨ සහකාර මුදල් අධිකාරී | - | 0112477130/0112477362 | |
| විද්‍යුත් තැපෑල | - | currency@cbsl.lk | |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය | - | www.cbsl.gov.lk | |
| මුදල් කෞතුකාගාරය, රාජගිරිය | - | 011 2477809 | |

**පළාත් කාර්යාල**

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | - | 025 2222048 | 025 2225689 |
| මාතර | - | 041 2222268 | 041 2222719 |
| මාතලේ | - | 066 2223367 | 066 2222175 |
| යාපනය | - | 021 2221855 | 021 2221857 |
| ත්‍රිකුණාමලය | - | 026 2242333 | 026 2242332 |

## 5. උද්ධමනය ඛනිජ තෙල් සහ බස් ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් 2012 මාර්තු මාසයේ දී ඉහළ නගියි

*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/07 = 100) මගින් මනිනු ලබන ලක්ෂ්‍යමය උද්ධමනය, ප්‍රධාන වශයෙන් ඛණිජ තෙල් මිල ගණන්, විදුලි ගාස්තු හා බස් ගාස්තු ඉහළ නංවමින් සිදුකළ සංශෝධන හේතුකොටගෙන අපේක්ෂා කළ අයුරින් සියයට 5.5 කින් ඉහළ ගියේය.*




කෙසේ වෙතත්, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2012 පෙබරවාරි මස පැවති සියයට 6.1 හි සිට මාර්තු මාසයේ දී සියයට 5.9 දක්වා නොකඩවා හයවන මාසයටත් මද වශයෙන් අඩු විය. මේ අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය අඛණ්ඩව හයවැනි මාසයටත් පහත වැටෙමින් 2012 මාර්තු මාසයේ දී සියයට 6.5 කරා ළඟා වූ අතර, ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය පෙර මාසයේ පැවති සියයට 4.7 හා සැසඳීමේ දී සියයට 4.9 දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

මාසික දර්ශකය මගින් පෙන්නුම් කරන පොදු මිල මට්ටම පූර්ව මාසයට සාපේක්ෂව 2012 මාර්තු මාසයේ දී සියයට 2.2 කින් ඉහළ යාමක් වාර්තා විය. දර්ශකය නිරපේක්ෂ වශයෙන් 2012 පෙබරවාරි මස පැවති 155.4 සිට 158.8 දක්වා ඉහළ නැගිණි. දර්ශකයේ මාසික ඉහළයාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර නොවන අයිතම කාණ්ඩයේ මිල ගණන් සියයට 4.0 කින් ඉහළ යාමයි. මෙම වැඩිවීම කෙරෙහි ඛනිජ තෙල් මිල ගණන්, බස් ගාස්තු සහ විදුලිය ගැලපුම් ගාස්තු 2012 පෙබරවාරි මස මැද භාගයේ සිට බලපැවැත්වෙන පරිදි ඉහළ නංවමින් කරන ලද සංශෝධන හේතු විය. ආහාර උප කාණ්ඩයේ මිල ගණන් සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. ආහාර උප කාණ්ඩය තුළ සහල්, එළවළු, අමු මිරිස්, බොහෝ මත්ස්‍ය වර්ග, ලොකු ළූණු, රතු ළූණු, අර්තාපල්, බිත්තර සහ කුකුළු මස් යන සෑම ප්‍රධාන ආහාර අයිතමයකම පාහේ මිල ගණන් සැපයුම් වර්ධනයන් හේතුකොටගෙන පහළ වැටුණු අතර, ඍතුමය හා අනෙකුත් සාධක හේතුවෙන් පළතුරු, සීනි සහ පරිප්පුවල මිල ගණන් ඉහළ නැගිණි. භූමිතෙල් මිලෙහි සහ විදුලිය මත වූ ඉන්ධන ගැලපුම් ගාස්තුවෙහි වැඩිවන ලෙස කළ සංශෝධන හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උප කාණ්ඩයෙහි මිල ගණණ් සියයට 4.3 කින් ඉහළ ගිය අතර, පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් සහ බස් ගාස්තු ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන ප්‍රවාහන උප කාණ්ඩය සියයට 9.6 කින් ඉහළ නැගිණි. මේ අතර, රෙදිපිළි හා පාවහන් (සියයට 1.3); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.1); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.1) යන උප කාණ්ඩවල ද මිල ගණන් ඉහළ යාම් වාර්තා විය. කෙසේ වෙතත්, සෞඛ්‍යය; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මාසය තුළ නොවෙනස්ව පැවතුණි.

## 6. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද)
## 2010, 2011 සහ 2012

(2006/07= 100)

| මාසය | දර්ශකය | | | මාසික වෙනස්වීම % | | | ලක්ෂ්‍යමය වෙනස්වීම % | | | වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම % | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 | 2010 | 2011 | 2012 |
| ජනවාරි | 140.4 | 149.2 | 154.8 | 1.9 | 1.4 | 0.3 | 7.1 | 6.2 | 3.8 | 3.2 | 6.1 | 6.5 |
| පෙබරවාරි | 141.1 | 151.3 | 155.4 | 0.5 | 1.4 | 0.4 | 7.5 | 7.2 | 2.7 | 3.3 | 6.1 | 6.1 |
| මාර්තු | 139.8 | 150.6 | 158.8 | -0.9 | -0.5 | 2.2 | 7.2 | 7.7 | 5.5 | 3.4 | 6.2 | 5.9 |
| අප්‍රේල් | 138.4 | 150.6 | | -1.0 | 0.1 | | 6.8 | 8.9 | | 3.8 | 6.4 | |
| මැයි | 140.1 | 151.5 | | 1.2 | 0.6 | | 5.6 | 8.2 | | 3.9 | 6.6 | |
| ජුනි | 141.2 | 151.2 | | 0.8 | -0.2 | | 5.1 | 7.1 | | 4.3 | 6.7 | |
| ජූලි | 141.2 | 151.7 | | 0.0 | 0.4 | | 4.4 | 7.5 | | 4.6 | 7.0 | |
| අගෝස්තු | 141.4 | 151.3 | | 0.2 | -0.3 | | 5.0 | 7.0 | | 4.9 | 7.1 | |
| සැප්තැම්බර් | 142.6 | 151.7 | | 0.8 | 0.3 | | 5.7 | 6.4 | | 5.3 | 7.2 | |
| ඔක්තෝබර් | 144.1 | 151.5 | | 1.1 | -0.1 | | 6.5 | 5.1 | | 5.7 | 7.1 | |
| නොවැම්බර් | 145.7 | 152.6 | | 1.1 | 0.7 | | 6.9 | 4.7 | | 6.1 | 6.9 | |
| දෙසැම්බර් | 147.2 | 154.4 | | 1.1 | 1.2 | | 6.8 | 4.9 | | 6.2 | 6.7 | |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව